# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2163/17 - 2020 පෙබරවාරි මස 18 වැනි අඟහරුවාදා - 2020.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

ඉහත කී ආඥාපනතේ 66 අ (1) වන වගන්තිය යටතේ කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත්වූ දොඩන්දූව වඩුගේ ආනන්ද විජේසිරි අයත් වන්නා වූ ජනතා විමුක්ති පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නාවූ ද, එම කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් ඒ පුරප්පාඩුව පිරවීම සඳහා කොටණගේ ජයමිණි කුමාරතුංග නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද ;

කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරි, මුහෙයියදීන් බාවා මුහම්මදු සුර්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66 අ (1) වන වගන්තිය ප්‍රකාරව ක්‍රියා කරමින් කොටණගේ ජයමිණි කුමාරතුංග, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් දැන් ප්‍රකාශ කරමි.

එම්. බී. එම්. සුර්යාන්,<br>
තේරීම්භාර නිලධාරී,<br>
කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය සභාව.

2020 පෙබරවාරි මස 17 වැනි දින,<br>
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,<br>
අනුරාධපුර.

03 - 30

1A - G 32056 — 27 (2020/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*